


8 වන පිටුවෙන් (ලයියට පිළිතුරු)

සාමාජිකයෙකුවත් ඔහු සමඟ එකඟ නොවුයේ මන්ද? එවිට විය යුතුව තිබුණේ තමාගේ මතය 100% ක්ම පරාජය වූ විට බහුතරයේ මතයට හිස නැවීම නොවේද? එහෙත් ලයියා කරන ලද්දේ ස්වයං විවේචන – විවේචන සහිත දීර්ඝ ලිපියක් පක්ෂයට ඉදිරිපත් කර පක්ෂයෙන් ඉල්ලා අස්වීම නොවේද? ඔහු නිල වශයෙන් ජ.වි.පෙ.න් ඉල්ලා අස්වන්නේ 1984 දී වුව පුලි කලබල මුවාවෙන් 1983 පුලි පක්ෂය තහනම් කළවිට තමාට ඇති ජීවිත තර්ජනයන් ගැන කිසිදු බියක් සැකක් නොමැතිව අත්අඩංගුවට පත් වීමත්, පසුව ඉක්මන් නිදහසක් ලබා ගැනීමත් ගැන සළකා බලනවිට මේ සියල්ල එම ආකාරයට පෙළ ගැසුනේ පක්ෂය හැර යාමට ලයියා තුළ වූ සැළසුම නිසායයි ජ.වි.පෙ.ට නොව සාමාන්‍ය විචක්ෂණ පුද්ගලයෙකුට වුව සිතීම අරුමයක් නොවේ. එය දන්නේ ලයියාගේ හර්ද සාක්ෂිය පමණකි.

උතුරේ දෙමළ කණ්ඩායම් ආයුධ සන්නද්ධව කළ අරගලය (ත්‍රස්තවාදය) ගැනත්, ස්වයං නීර්ණ අයිතිය ගැනත් බෝපගේ සහෝදරයා දරණ මතය වෙනම කථා කළයුතු මාතෘකාවකි. මාක්ස් - ලෙනින් වාදයේ හා කොමියුනිස්ට් වාදයේ පදනම වූ ප්‍රධාන කොන්දේසි පවා වර්තමාන දේශපාලන ප්‍රවණතා තුළ අවලංගුව පවතිද්දී ස්වයං නීර්ණ අයිතිය පමණක් වලංගුව ඇත්තේ කෙසේද? කුමන හෝ කරුණු මත ජාතීන් වෙන්වී රටවල් කැබලි කරගන්නා විට එයින් ඇතිවන වාසිය සමාජ වාදයටද? රටවල් කැබලිකර බෙදා වෙන් කරන අධිරාජ්‍යවාදී උපාය මාර්ගයටද? ස්වයං නීර්ණ අයිතිය නම් වූ ප්‍රලාපය යටතේ රටවල් බෙදාගෙන දේශසීමා, වැට කඩොලු ගහගත්විට උත්තරීතර කොමියුනිස්ට් ලෝකයේ උත්කෘෂ්ඨ ප්‍රාර්ථනය වූ ලෝකය, දේශසීමා වැටකඩොලු නැති "එකම යායක්" වන්නේ කෙසේද?

ස්වයං නීර්ණ අයිතිය ලැබිය යුතු සිංහල ජනතාවක්ද, "සිංහල ඊළමක්" දිනාගත යුතු ප්‍රදේශද අප රට තුළ පවතින බව ලයියා දන්නවාද? ඒ තරමටම දෙමළ පීඩිතයෝ සහ සිංහල පීඩිතයෝ එකම ආකාරයේ ප්‍රශ්න සමුදායකට වෙනසක් නැතිවම මුහුණ පා සිටිති. එහෙත් සංඛ්‍යාවෙන් සුළු ජාතියක්ය යන විශේෂය මත දෙමළ ජනතාව ගැන මිස සිංහල ස්වයං නීර්ණ අයිතියක් ගැන කිසිවෙකු කථා නොකරති. ඒ දෙමළ අයිතීන් ගැන කථා කරනවිට මෙන් මල්ල නොපිරෙන නිසාය.

ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න ඉරිදා ලක්බිම පත්‍රයට ලියන "නිනව්ව" කොලමේ 2009 මායි 31 පත්‍රයට මෙසේ ලියයි.

"ජනතා විමුක්ති පෙරමුණත් දෙමළ ජනතාවගේ ස්වයං නීර්ණ අයිතිය පිළිගත් බව ප්‍රකාශ කළත් එය ව්‍යාජයක් බව පසුව හෙළිදරව් උනා. මේ ගැන විධිමත්ව එදා කථා කළේ ලයනල් බෝපගේ සහෝදරයා පමණයි. එනිසාම වෙන්න ඕන ඔහුට ඒ පක්ෂය ඇතුළේ තවදුරටත් ඉන්න බැරි උනේ. තවමත් ලයනල් බෝපගේ ඒ අදහස් වෙනස් කරලා නෑ. එයාට හිතවත් අය දැන් වාමාංශික සන්ධානයක් හැටියට තිබෙන එකමුතුව තුළ අපිත් එක්ක එකට වැඩ කරනවා."

ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න ගැන කිසිවෙකු විසින් මේ තාක් කරන ලද ඉතාම යථාර්ථවාදී අර්ථ කථනය කරන ලද්දේ මහාචාර්ය කුසුමා කරුණාරත්න විසිනි. "ජාතියේ පවට උපන් සිංහලයාය" යන්න එම විශේෂණයයි.

"එක පිහාටු ඇති කුරුල්ලෝ එක්ව ලගිති." යනුවෙන් ඉංග්‍රීසි කියමනක් තිබේ. (The bividoof same feathers of lock together) එමනිසා, තර්කානුකූලව ජීවත් නොවන, ජීවත්වෙන්න අවශ්‍ය පිළිවෙලට තර්ක ගොඩ නගන "විකටබාහුලා" සමඟ ලයියා ලැගීම ගැන අපිට පුදුමයක්, දුකක් හෝ කඳුළුද නැත. පුංචි කණගාටුවක් ඇත්නම් ඒ ලයියා සමඟ සිටිනවා යයි කියන පිරිස උදෙසා පමණකි.

ලයියලා-බාහුලා කියන ඔය ස්වයං නීර්ණ අයිතිය ගැන බහුතරයක් වන සාමාන්‍ය දෙමළ ජනතාවගේ සිත්සතන් තුළ කොට්ටකෙලෙංගුවකට, තල් හකුරු කෑල්ලකට, මසාල වඩයකට ඇති බැඳීම හෝ සැලකිල්ලවත් ඇතැයි සිතිය නොහැක. ඔවුන්ගේ ජීවිත ප්‍රාර්ථනා ලයියලා හිතන විකාර නොවේ.

